කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Land & Irrigation**
**පශු සම්පත් අංශය / கால்நடை பிரிவு / Livestock Division**
80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | Livestock/02/15/08/07-V | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2026.06.10 |

1. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
5. ප්‍රධාන ලේකම්, ( බස්නාහිර/ සබරගමුව/ දකුණ/ වයඹ/ මධ්‍යම/ ඌව/ උතුරු මැද/ නැගෙනහිර/ උතුර) පළාත් සභාව
6. පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර/ සබරගමුව/ දකුණ/ වයඹ/ මධ්‍යම/ ඌව/ උතුරු මැද/ නැගෙනහිර/ උතුර) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම - 2026

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/7/2140/2024 හා 2026.05.26, 2026.06.09 දිනැති ලිපිවල අනුමැතිය අනුව, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා එම සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන අතර, ඊට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා අයදුම්පත මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

02. මෙම අයදුම්පත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ agrimin.gov.lk හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ www.daph.gov.lk යන වෙබ් අඩවි ඔස්සේ බාගත කර ගත හැකි අතර, **අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2026.07.10 වේ.**

03. මෙහිදී නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් අදාළ නිර්දේශ සහිතව 2026.07.10 දිනට පෙර ලියාපදිංචි තැපැල මගින් **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්**, වෙත යොමු කළ යුතු ය.

04. මෙම අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් නොපමාව අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය අගය කරමි.

ප්‍රියංගා එච්. හඳුන්හේව
අතිරේක ලේකම්(පාලන)
පශු සම්පත් අංශය
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත්

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම විෂයභාර පළාත් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
   (බස්නාහිර/ සබරගමුව/ දකුණ/ වයඹ/ මධ්‍යම/ ඌව/ උතුරු මැද/ නැගෙනහිර/ උතුර)
3. අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) (රා.ආ) - කර. දැ.ගැ.ස.